# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1798/14 - 2013 පෙබරවාරි මස 19 වැනි අඟහරුවාදා - 2013.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන හා වෙළඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, පහත උපලේඛනයෙහි විස්තර කරනු ලබන බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2012 අංක 04 දරන ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය 2012.08.07 දින බස්නාහිර පළාත් සභාව විසින් සභා සම්මත කිරීමෙන් පසුව ඒ සඳහා 2012.12.13 දින බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුඥාව ලබා දී ඇති බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රසන්න රණතුංග,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය,<br>
මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන,<br>
හා පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා,<br>
ආර්ථික ප්‍රවර්ධන හා වෙළඳ අමාත්‍ය.

2013 පෙබරවාරි මස 11 වැනි දින,<br>
කොළඹ 07, ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,<br>
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

### බස්නාහිර පළාතේ 2012 අංක 04 දරන ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය

බස්නාහිර පළාත තුළ පිහිටි රජයේ ඉඩම්, රජය හෝ පළාත් සභාව විසින් ප්‍රයෝජනයට ගැනීම විධිමත් කිරීම සඳහාත් යම් පුරවැසියෙකුට හෝ යම් සංවිධානයකට පවරාදීම සඳහාත් එම ඉඩම් නියාදනය කිරීම පිළිබඳව පළාත් සභාවේ උපදේශය සඳහා විධිවිධාන සැලැස්වීම සඳහාත් ඊට ආනුෂාංගික වූ කාරණා සඳහාත් බස්නාහිර පළාතේ 2002 අංක 07 දරන ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහාත් වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.


1A - PG 001566— 435 (2013/02)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

01. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2012 අංක 04 දරන ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

පළාත් සභා විෂයයන් සඳහා භාවිතා කරන ඉඩම්.

02. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනය වන විටත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ පළාත් සභා විෂයයන් සඳහා භාවිතා කරන යම් ඉඩමක් වේ නම්, එය පළාත් සභාව වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුව) II පරිශිෂ්ටයේ 1 හා 1.2 යටතේ ලබාදී ඇති ඉඩමක් සේ සැලකිය යුත්තේ ය.

පළාත් සභාව විසින් රජයේ ඉඩම් ලබා ගැනීම.

03. (1) කිසියම් පළාත් සභා විෂයයක් සඳහා අළුතින් රජයේ ඉඩමක් අවශ්‍ය වන්නේ නම් එම ඉඩම පළාත් සභාවට ලබා දෙන ලෙස පළාත් ඉඩම් කොමසාරිස් විසින් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටිය යුතු ය.

(2) යම් පළාත් සභා කාර්යයක් සඳහා රජයේ ඉඩම් කොටසක් ලබා දෙන ලෙස පළාත් ඉඩම් කොමසාරිස්වරයා වෙත ඉල්ලීමක් ලැබුණු විට ඔහු විසින් තමාට ප්‍රමාණවත් යැයි හැඟෙන තරමට, අදාල ඉල්ලීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් කිරීමෙන් පසු එකී ඉඩම එම කාර්යය සඳහා ලබා ගැනීමට යෝග්‍ය වන බවට සෑහීමට පත් වන්නේ නම්, අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව එකී ඉල්ලීම ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) යම් පළාත් සභා විෂයයක් සඳහා ඉහත (1) උප වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් අනුව පළාත් සභාවට ලැබෙන රජයේ ඉඩමක් එම විෂයය සඳහාම ප්‍රයෝජනයට ගැනීම කල යුත්තේ ය. මේ විෂය සඳහා පළාත් සභාව වෙත ලැබෙන ඉඩමක් වෙනත් විෂයයක් සඳහා ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය වන්නේ නම් එය රජයේ ඉඩම් පාලනය කරනු ලබන නීතිවලට අනුකූලව සිදු කළ යුත්තේ ය.

04. (1) පළාත් සභා විෂයයන් සම්බන්ධයෙන් අවශ්‍ය වී ඇති එම පළාත ඇතුළත ඇති, රජයේ ඉඩම් ආණ්ඩුව විසින් ලබා දීමෙන් අනතුරුව පළාත් සභාව විසින් එම රජයේ ඉඩම්, එම කාරණය පාලනය කරන නීති හා ප්‍රඥප්තිවලට අනුකූලව පරිපාලනය කිරීම පාලනය කිරීම සහ ප්‍රයෝජනයට ගැනීම කළ යුතු ය.

(2) රජයේ ඉඩමක් ආණ්ඩුව විසින් ප්‍රයෝජනයට ගනු ලැබීම සම්බන්ධයෙන් පළාත් සභාවේ එකඟත්වය ලබාදීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය රීති මඟින් නියම කළ යුත්තේ ය.

05. පළාත් සභා බල ප්‍රදේශය තුළ පිහිටි රජයේ ඉඩම්,

(අ) පදිංචි වීම සඳහාත්,
(ආ) කෘෂිකාර්මික කටයුතු වල යෙදීම සඳහාත්,

අවසර පත්‍ර ලබාදීම අනුමත කිරීමට පළාත් ඉඩම් කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය.

ආණ්ඩුව ප්‍රයෝජනයට ගනු ලබන රජයේ ඉඩම.

06. (1) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අඩංගු සංචෘත හෝ සමගාමී ලැයිස්තුවල සඳහන් විෂයයක් සඳහා රජයේ ඉඩමක් ප්‍රයෝජනයට ගැනීමට ආණ්ඩුව විසින් විමසන අවස්ථාවක එම ඉඩම,

(අ) අවශ්‍ය වන කාරණය
(ආ) එහි පිහිටීම
(ඇ) එහි වපසරිය
(ඈ) මායිම්

යන විස්තර ඇතුළත් ලිඛිත ඉල්ලීමක් කරන ලෙස පළාත් සභාව විසින් ආණ්ඩුවෙන් ඉල්ලා සිටිය යුතු ය.

(2) ඉහත (1) උප වගන්තියේ සඳහන් පරිදි ඉල්ලීමක් පළාත් සභාව වෙත ලැබුණු පසු,

(අ) එම ඉල්ලීම ඉටු කළ හැකි නම් ඒ බව දින 42ක් ඉකුත් වීමට පෙර ආණ්ඩුව වෙත දන්වා සිටීම ;

*හෝ*

(ආ) එම ඉල්ලීම ඉටු කළ නොහැකි අවස්ථාවක එම ඉඩම වෙනුවට විකල්ප ඉඩමක් ආණ්ඩුව වෙත යෝජනා කිරීම ;

*හෝ*

පළාත් සභාවේ කාර්යයක් විය යුතු ය.

(3) රජයේ ඉඩමක් ආණ්ඩුව විසින් ප්‍රයෝජනයට ගනු ලැබීම සම්බන්ධයෙන් පළාත් සභාවේ එකඟත්වය ලබාදීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටිය පළාත් සභාව විසින් සම්පාදනය කළ යුතු වන්නේ ය.

07. ආණ්ඩුවේ ප්‍රයෝජනය සඳහා පළාත තුළ පිහිටි කිසියම් ඉඩම් කොටසක් යොදා ගැනීම පිණිස පළාත් සභාවේ එකඟතාවය ලබාදීමේදී, අදාළ ඉඩම, නිදහස්ව තිබෙන්නේ වූ නමුත්, පළාත් සභාවේ එකඟතාවය ලබාදීමේදී සැලකිය යුතු කරුණු.

(අ) වෙනත් කාර්යයක් සඳහා වෙන් කර තිබේද නැතහොත්,

(ආ) පළාතට විශේෂ වූ කිසියම් ආර්ථික, සංස්කෘතික, පුරා විද්‍යාත්මක හෝ පාරිසරික වැදගත්කමකින් යුක්ත වන්නේ ද යන කරුණු සැලකිල්ලට ගත යුතු ය.

08. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනය දක්වා ආණ්ඩුව විසින් සංවෘත හෝ සමගාමී විෂයයක් සඳහා ප්‍රයෝජනයට ගනිමින් තිබුණු කිසියම් ඉඩමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි පළාත් සභාව විමසා ආණ්ඩුව විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩමක් සේ සැලකිය යුතු ය. ආණ්ඩුව විසින් ප්‍රයෝජනයට ගනිමින් තිබුණු ඉඩම්.

09. (1) ඉඩම් කොටසක් බැහැර කරනු ලැබීම සඳහා පුද්ගලයින් තෝරා ගැනීම ඉඩම් කච්චේරියක් මඟින් සිදු කළ යුතු ය.

(2) ඉහත (1) උප වගන්තිය යටතේ ඉඩම් කච්චේරියක් පැවැත්වීමේදී පහත පියවර අනුගමනය කළ යුතු ය.

(අ) පදිංචිය සඳහා සහ/හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා යම් ඉඩම් කොටසක් බැහැර කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් අදහස් කරන අස්ථාවේදී ඉඩම් කච්චේරියක් පැවැත්වීම සඳහා ඊට අදාළව ව්‍යාපෘති වාර්තාවක්, ඉඩම් කච්චේරි යෝජනාවක්, ඉඩම් කච්චේරි නිවේදනයේ පිටපතක් සහ ඉඩමේ පිඹුර/අනුරේඛනයේ පිටපතක් ඉඩම් කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වන්නේ ය.

(ආ) ඉහත (අ) ඡේදය පරිදි අනුමැතිය ලද ඉඩම් කච්චේරි නිවේදනය ආදර්ශ අයදුම්පතක් සමග ප්‍රාදේශීය ලේකම්ගේ අත්සනින් සකස් කොට ප්‍රාදේශය තුළ පුළුල් ප්‍රචාරයක් ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම් ප්‍රමාණවත් යැයි සලකන ආකාරයට ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය. ඉල්ලුම්කරුවනට, ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාල සීමාවකට ඉඩ තබමින් අවම වශයෙන් දින තිහක වත් කාලය ලබා දෙමින් ඉඩම් කච්චේරි නිවේදනය ප්‍රසිද්ධ කළ යුතු ය.

(ඇ) ප්‍රසිද්ධියට පත් කරන ලද ඉඩම් කච්චේරි නිවේදනයෙහි සඳහන් දිනයන්හි නියමිත ස්ථානයේදී හා නියමිත වේලාවන්හිදී ඉඩම් කච්චේරි පැවැත්විය යුතු ය. එම කරුණු වල කිසියම් වෙනස් කිරීමක් අවශ්‍ය වුවහොත් එසේ වෙනස් කිරීම සඳහා පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතු අතර, එම අනුමැතිය වෙනස් කිරීම ඉඩම් කච්චේරිය පැවැත්වෙන දිනට යටත් පිරිසෙයින් දින දහයකටවත් පෙර ඉඩම් කච්චේරි නිවේදනය ප්‍රසිද්ධ කළ ආකාරයටම ප්‍රසිද්ධ කළ යුතු ය.

(ඈ) ඉඩම් කච්චේරි නිවේදනයෙහි සඳහන් දින හෝ ඊට පෙර ලැබී ඇති අයදුම්පත්‍ර අතුරින් සුදුස්සන් තෝරා ගැනීම කළ යුතු ය. නියමිත දිනට පසුව ලැබී ඇති

අයදුම්පත්‍ර සම්බන්ධයෙන් අයදුම්කරුවකු විසින් ප්‍රාදේශීය ලේකම් සැහීමකට පත් වන අයුරින් හේතු ඉදිරිපත් කර ඇත්නම්, සති අන්ත නිවාඩු දින හැර වැඩ කරන දින (03) තුනක ප්‍රමාද කාලයක් තුළ දී ලැබී ඇති අයදුම්පත්‍රයක් සේ සලකා බැලීමට අවසර දීමට ප්‍රාදේශීය ලේකම්ට පුළුවන.

(ඉ) ඉඩම් කච්චේරි පවත්වා දින දාහතරක් ඇතුළත ඉඩම් ලැබීමට සුදුස්සන්ගේ නාම ලේඛනය ප්‍රමුඛතා අනුපිළිවෙලට ප්‍රසිද්ධ කර එම තේරීම් පිළිබඳ විරෝධතා කැඳවීම කළ යුතු ය. ඉඩම් කච්චේරි නිවේදනය ප්‍රසිද්ධ කළ ආකාරයට මෙම තේරීම් ලැයිස්තුව ද ප්‍රසිද්ධ කළ යුතු ය.

(ඊ) විරෝධතා ඉදිරිපත් වී තිබේ නම්, නියමිත දිනයක, නියමිත වේලාවකදී පෞද්ගලිකව පැමිණ විරෝධතාවය දැක්වීමට විරෝධතා කරුවන්ට ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමක් කළ යුතු ය. විරෝධතා පරීක්ෂණයට සහභාගී වන ලෙසට විරෝධතාවයන්ට ලක්වූ තැනැත්තන්ට ද ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමක් කළ යුතු ය.

(උ) විරෝධතා පරීක්ෂණ අවසන් වී දින දාහතරක් ඇතුළත ඉඩම් භාරදීම සඳහා තෝරාගත් තැනැත්තන්ගේ නාම ලේඛනය ඉඩම් කච්චේරි නිවේදනය ප්‍රසිද්ධ කළ ආකාරයටම ප්‍රසිද්ධ කළ යුතු ය.

අනුග්‍රාහී පදනම මත තෝරා ගැනීම.

10. යම් විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ඉඩම් කොටසක් බැහැර කිරීම සඳහා යම් පුද්ගලයෙකු හෝ සංවිධානයක් අනුග්‍රාහී පදනම මත තෝරා ගැනීමේදී පළාත් සභාවේ එකඟතාවය ලබාදීමට අමාත්‍ය මණ්ඩලයට බලය ඇත්තේ ය.

11. බස්නාහිර පළාත තුළ පිහිටි රජයේ ඉඩමක් බැහැර කිරීමට මෙම පළාත් සභාවේ උපදේශය ලබා දීම සිදු කිරීමේදී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු ය.

(අ) ඉඩම හඳුනා ගැනීම ;
(ආ) ඉඩම මැන සලකුණු කිරීම ;
(ඇ) අරමුණුගත කාරණයට අදාළව නිර්දේශ සහ වාර්තා ප්‍රාදේශීය ලේකම් වෙතින් පළාත් ඉඩම් කොමසාරිස් වෙත ලබා ගැනීම ;
(ඈ) පළාත් ඉඩම් කොමසාරිස් එම නිර්දේශ සහ වාර්තා ලැබුණු පසුව විධිමත් විමර්ශනයකට/විමසුමකට ලක් කිරීම ;
(ඉ) පවතින පනත් නීති, ප්‍රඥප්ති හා ඉඩම් පරිහරණ සැලසුම්වලට අනුකූලව එම නිර්දේශ වාර්තා ලේකම් වෙත යොමු කිරීම ;
(ඊ) අමාත්‍ය මණ්ඩලයෙහි අනුමැතිය ලබා ගැනීම ;
(උ) අනුමැතිය ලැබීමෙන් අනතුරුව බැහැර කිරීමේ ක්‍රියාවලියේ ඉදිරි කටයුතු සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත පළාත් ඉඩම් කොමසාරිස් විසින් නිර්දේශය ලබාදීම.

දීමනා පත්‍ර නිකුත් කිරීම.

12. යම් ඉඩම් කොටසක් වෙනුවෙන් අවසරපත්‍රයක් ලැබූ පුද්ගලයෙකු විසින් එකී අවසර පත්‍රයේ සඳහන් කොන්දේසි සියල්ල සපුරා ඇති අවස්ථාවක එම ඉඩම වෙනුවෙන් දීමනා පත්‍රයක් ලැබීමට ඉදිරි කටයුතු කිරීම සඳහා එකී පුද්ගලයා සුදුසුකම් ලබන්නේ ය.

පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව.

13. බස්නාහිර පළාත තුළ රජයේ ඉඩම් පාලනය හා පරිපාලනය කිරීම සඳහා මින්මතු බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන බස්නාහිර පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවක් පැවතිය යුත්තේ ය.

පළාත් ඉඩම් කොමසාරිස් ධුරයක් ඇති කිරීම.

14. (1) මෙම ප්‍රඥප්තිය යටතේ තමන්ට පැවරී තිබෙන බලතල, රාජකාරී හා කාර්යයන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා පළාත තුළ පිහිටි රජයේ ඉඩම් පරිපාලනය හා පාලනය සම්බන්ධයෙන් ඉඩම් නිලධාරීන් වෙත පවරා හා නියම කර තිබෙන බලතල හා රාජකාරී පවරා ඉටු කිරීම සම්බන්ධයෙන් ඉඩම් නිලධාරීන්ගේ කටයුතු පොදුවේ අධීක්ෂණය කිරීම හා මෙහෙයවීම සඳහා ද වගකිය යුතු වන්නා වූ පළාත් ඉඩම් කොමසාරිස් ධුරයක් තිබිය යුතු වන්නේ ය.

(2) පළාත් ඉඩම් කොමසාරිස් ලේකම්ගේ පරිපාලනයට යටත්ව ස්වකීය ධුරයේ කටයුතු කළ යුතු ය.

15. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා වරින් වර අවශ්‍ය විය හැකි පරිදි නියෝජ්‍ය හා සහකාර පළාත් ඉඩම් කොමසාරිස් වරුන් පත් කරනු ලැබිය හැක්කේ ය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් නියෝගයක් යටතේ පළාත් ඉඩම් කොමසාරිස් සතු කිසියම් බලයන්, යුතුකමක් හෝ කාර්යයක් පළාත් ඉඩම් කොමසාරිස්ගේ සාමාන්‍ය හෝ විශේෂ උපදෙස් වලට යටත්ව ක්‍රියාවේ යොදවන්නට, ඉටු කරවන්නට හෝ කරන්නට කිසියම් නියෝජ්‍ය පළාත් ඉඩම් කොමසාරිස්වරයෙකුට හෝ සහකාර පළාත් ඉඩම් කොමසාරිස්වරයෙකුට සාමාන්‍ය වශයෙන් හෝ විශේෂයෙන් බලය දෙන්නට පළාත් ඉඩම් කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය.

16. (1) පළාත තුළ හෝ පළාත තුළ ඇති කිසියම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වෙනුවෙන් හෝ එක් ඉඩම් නිලධාරියෙකු හෝ කිහිපදෙනෙකු පත් කරනු ලැබිය හැකි ය.

(2) එබඳු සෑම නිලධාරියෙකු විසින්ම තමන් පත්වී සිටින පළාතේ හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම ප්‍රඥප්තිය යටතේ පැවරී ඇති රාජකාරී හා බලතල සියල්ල හෝ ඒවායින් කිසිවක් හෝ පළාත් ඉඩම් කොමසාරිස්වරයා විසින් නියම කරන ආකාරයට හා ප්‍රමාණය ඉටු කර ක්‍රියාත්මක කර මෙහෙයවිය හැකිය.

(3) ඉඩම් නිලධාරියෙකුට තමා වෙත ඉඩම් පරිපාලනය සම්බන්ධයෙන් පැවරී තිබෙන රාජකාරී ඉටු කිරීම පිළිබඳව පළාත් ඉඩම් කොමසාරිස්වරයා විසින් කළින් කළ සාමාන්‍ය හෝ විශේෂ නියමයන් කළ හැකිය. තවද එබඳු රාජකාරී සම්බන්ධයෙන් කිසියම් සැකයක් හෝ දුෂ්කරතාවයක් උද්ගත වුවහොත් ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සඳහා එම කාරණය තමා වෙත ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට පළාත් ඉඩම් කොමසාරිස්වරයාට බලය ඇත්තේ ය.

(4) පළාත් ඉඩම් කොමසාරිස්ගේ කවර නියමයක් හෝ තීරණයක් අවස්ථාවෝචිත පරිදි ඉඩම් නිලධාරී විසින් පිළිපැදීමත්, ක්‍රියාවේ යෙදවීමත් කළ යුතු ය.

17. (1) අදාළ නීතියෙහි හෝ ප්‍රඥප්තියෙහි සඳහන් විධිවිධාන අනුව යම් අවසරපත්‍ර ලාභියෙකු තමා ඇවෑමෙන් හිමිවන්නෙකු නම් නොකළහොත් හෝ අදාළ නීතියෙහි සඳහන් විධිවිධාන අනුව ඉඩම් අනුප්‍රාප්තිය ලැබීමට හිමිකමක් ඇත්තෙකු නොමැතිවීමක් හෝ එසේ අනුප්‍රාප්ත වීමට අකමැති වීමෙන් හෝ එම ඉඩම රජය වෙත පැවරුනා සේ සැලකිය යුතු ය. ඉඩම් කොටසකට අනුප්‍රාප්ත වීමට අසමත් වූ විට එම ඉඩම රජය වෙත පැවරෙන බව.

(2) එවැනි ඉඩමක භුක්තිය ප්‍රාදේශීය ලේකම් විසින් භාරගත යුතු ය.

18. අවසර පත්‍රයක ඇතුළත් කිසියම් කොන්දේසියක් පිළිපැදීමට අවසර පත්‍රලාභියෙකු අසමත් වී ඇති බව ප්‍රාදේශීය ලේකම්ට පෙනී ගියහොත් එකී අවසර පත්‍රය අවලංගු නොකිරීමට සෑහෙන හේතු දැක්වීම සඳහා අවස්ථාවක් ලබාදීමේ නිවේදනයක් නියමිත ආකෘතියට අනුව අවසරපත්‍ර ලාභියා වෙත යැවීමට ප්‍රාදේශීය ලේකම් ක්‍රියා කළ යුතු ය. එකී පරීක්ෂණය කරනු ලබන දිනය, වේලාව හා ස්ථානය එම නිවේදනයෙහි නිශ්චිතව සඳහන් කළ යුතු ය. කොන්දේසි කඩා අවසරපත්‍ර ලාභියා වෙත නිවේදනය යැවීම.

19. ඉහත 18 වැනි වගන්තිය යටතේ නිවේදනයේ සඳහන් වන පරීක්ෂණ දිනය එකී නිවේදනය නිකුත් කරන ලද දින සිට දින 30 කට පෙර දිනයක් නොවිය යුතු ය. හේතු දැක්වීමට දෙනු ලබන කාලය.

20. (1) ඉහත 18 වගන්තිය යටතේ නිකුත් කරනු ලබන නිවේදනයේ පිටපතක් අවසර පත්‍ර ලාභියාට භාර දෙනු ලැබිය යුතු අතර, එහි තවත් පිටපතක් අදාළ ඉඩමේ ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කිරීමට සැලැස්විය යුතු ය. ඉඩම හා සම්බන්ධයෙන් ඇති හෝ අවලංගු කිරීමට බලය ඇතැයි හෝ සලකනු ලබන ඕනෑම පුද්ගලයෙකු වෙත එම නිවේදනයේ පිටපත් භාර දීමට සැලැස්විය හැකි ය. නිවේදනය භාරදීම සහ ප්‍රදර්ශනය කිරීම.

(2) ඉහත 18 වැනි වගන්තිය යටතේ නිවේදනයේ සඳහන් අවසරපත්‍ර ලාභියා සොයා ගැනීමට නොහැකි අවස්ථාවකදී ඔහුගේ පවුලේ සාමාජිකයෙකුට හෝ ඔහු හා වෙසෙන වෙනත් අයෙකුට භාරදීම අවසරපත්‍ර ලාභියාට නිසි පරිදි භාරදීමක් සේ සැලකිය යුතු ය. එසේ භාරදීමට හෝ කෙනෙකු නොමැති විටෙක නිවේදනයේ පිටපතක් අවසරපත්‍ර ලාභියාගේ නිවසේ හෝ ඒ අවට ප්‍රකට ස්ථානයක අලවා ප්‍රසිද්ධ කිරීම එය නිසි පරිදි භාරදීමක් සේ සැලකිය යුතු ය.

(3) නිවේදනය ඉහත කවර ආකාරයෙන් භාරදුන්නේ ද යන්න එම කාර්ය පැවරුණු නිලධාරියා විසින් ප්‍රාදේශීය ලේකම් වෙත ලිඛිත වාර්තාවකින් සනාථ කළ යුතු ය.

අවසරපත්‍ර ලාභියා ඉදිරිපත් නොවූ විට අවලංගු කිරීම.

21. (1) අවසරපත්‍ර ලාභියා 18 වැනි වගන්තිය යටතේ වූ නිවේදනයේ ප්‍රකාර කරුණු කීමට ඉදිරිපත් නොවුවහොත් හෝ ඉදිරිපත් වී අවසරපත්‍රය අවලංගු කිරීමට විරුද්ධව කරුණු කීමට නැතැයි ප්‍රකාශ කළහොත් හෝ නිවේදනය නිසි පරිදි භාරදී ඇති බව හා කිසියම් කොන්දේසියක් කඩකර ඇති බවට ප්‍රාදේශීය ලේකම් සෑහීමකට පත් වන්නේ නම්, එම අවසරපත්‍රය අවලංගු කිරීමේ නියෝගයක් කිරීමට ඔහුට පුළුවන. එසේ වුවද එවැනි නියෝගයක් කළ යුත්තේ නිවේදනයෙහි නියමිත දින සිට දින 28ක් ඉක්මවූ පසුව පමණකි.

(2) 18 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද නිවේදනයේ සඳහන් දිනයේ පෙනී සිටීමට නොහැකි වූ කිසියම් අවසරපත්‍ර ලාභියෙකු එම නියමිත දිනයේ සිට දින 14ක් ඇතුළත ඉල්ලීමක් කරමින් අවසරපත්‍රය අවලංගු නොකිරීමට හේතු දැක්විය හැකි බවත්, පරීක්ෂණ දිනයේ දී නොවැළැක්විය හැකි කරුණක් නිසා පැමිණීමට නොහැකි වූ බවත්, ප්‍රාදේශීය ලේකම් වෙත ඒත්තු ගැන්වුවහොත් හේතු දැක්වීම සඳහා වෙනත් දිනයක් නියම කළ හැකි ය.

අවසරපත්‍ර ලාභියා ඉදිරිපත්ව හේතු දැක්වූ විට ගත යුතු ක්‍රියාමාර්ගය.

22. (1) ඉහත 18 වැනි වගන්තිය යටතේ හෝ 21(2) වගන්තිය යටතේ හෝ නියම කරන ලද දිනයෙහි අවසරපත්‍ර ලාභියා ඉදිරිපත් වී තම අවසර පත්‍රය අවලංගු නොකිරීමට හේතු දක්වන ලද අවස්ථාවකදී ප්‍රාදේශීය ලේකම් විසින් කරුණු විභාග කිරීමෙන් අනතුරුව කිසියම් කොන්දේසියක් කඩකර ඇති බවට සෑහීමකට පත් වුවහොත් ඔහු විසින් අවසර පත්‍රය අවලංගු කිරීමට නියෝග කල හැකිය.

(2) ඉහත කී වගන්ති යටතේ නියම කරන ලද විභාගයක් කල් දැමීමට ප්‍රාදේශීය ලේකම්ට හැකි අතර, එවැනි කල් දැමීමකදී ඊළඟ විභාගය පැවැත්වෙන දිනය, වේලාව හා ස්ථානය අවසරපත්‍ර ලාභියාට ලිඛිතව දැන්විය යුතු ය.

(3) ප්‍රාදේශීය ලේකම් විසින් 21 හෝ 22 වගන්තිය යටතේ නියෝගයක් දීමට පෙර සාක්ෂි විමසිය යුතු ය. දිවුරුම් පිට හෝ සහතික කර හෝ සාක්ෂි ලබාගත යුතු ය.

අවලංගු කිරීමේ නියෝගයේ දිනය.

23. ප්‍රාදේශීය ලේකම් විසින් අවලංගු කිරීමේ නියෝගය කළ දිනය, එකී නියෝගයේ සඳහන් කළ යුතු ය.

අවසරලාභියා නියෝග භාරදීම හා ප්‍රදර්ශනය කිරීම.

24. (1) ප්‍රාදේශීය ලේකම් විසින් 22 වගන්තිය යටතේ කරන ලද නියෝගයේ පිටපතක් අදාල අවසරපත්‍ර ලාභියා වෙත වහාම භාර දිය යුතු අතර, එහි පිටපතක් අදාල ඉඩමේ ප්‍රකට ස්ථානයක අලවා ප්‍රදර්ශනය කළ යුතු ය. මෙම නියෝගයට විරුද්ධව දින 30ක් ඇතුළත පළාත් ඉඩම් කොමසාරිස්ට අභියාචනා කිරීමට හැකි බව ද, එකී නිවේදනයේ සඳහන් කළ යුතු ය.

අභියාචනා කිරීමට ඉඩදී ඇති කාලසීමාව.

(2) 22 වැනි වගන්තිය යටතේ කරනු ලබන අභියාචනයක් අදාල නියෝගයේ දින සිට දින 30ක් ඇතුළත් ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය. කාලය ගණන් ගැනීමේදී නියෝග නිකුත් කළ දිනය ගණන් නොගත යුතු ය.

අභියාචනා කිරීමට ඉඩදී ඇති කාලසීමාව.

25. 24 වැනි වගන්තිය යටතේ කරනු ලබන අභියාචනයක් අදාල නියෝගයේ දින සිට දින 30ක් ඇතුළත් ලිඛිතව ඉදිරිපත් කළ යුතු ය. කාලය ගණන් ගැනීමේදී නියෝග නිකුත් කළ දිනය ගණන් නොගත යුතු ය.

26. අභියාචක හෝ ඔහුගේ නියෝජිතයෙකු සිටියදී අභියාචනය සලකා බැලීමෙන් පසු පළාත් ඉඩම් කොමසාරිස් විසින් — පළාත් ඉඩම් කොමසාරිස්ගේ බලතල.

(අ) වැඩිදුර විභාග කරවීමට කරුණු ඉදිරිපත් කරවීම හෝ සාක්ෂි විභාග කරවීමට හෝ
(ආ) අභියාචනයට ඉඩදී නියෝගය බැහැරලීමට හෝ
(ඇ) නියෝගය සංශෝධනය කිරීමට හෝ
(ඈ) නියෝගය ස්ථිර කිරීමට හෝ
(ඉ) සාධාරණ සහ යුක්ති සහගත වෙනත් නියෝගයක් දීමට හෝ,

ක්‍රියා කල හැකිය.

27. (1) පළාත් ඉඩම් කොමසාරිස් විසින් 26 වැනි වගන්තිය යටතේ කරනු ලබන තීරණය ප්‍රාදේශීය ලේකම් වෙත වහාම දැන්විය යුතු ය. — පළාත් ඉඩම් කොමසාරිස්ගේ තීරණය දැන්වීම.

(2) 26 වැනි වගන්තිය යටතේ පළාත් ඉඩම් කොමසාරිස්ගේ උපදේශනය සෑම කාර්යයක් සඳහාම අවසාන හා තීරණාත්මක වන්නේ ය :

එසේවුව ද, පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ තීරණයෙන් අතෘප්තිමත් වූ අයෙකුට විෂයභාර අමාත්‍යවරයාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට හැකි ය.

28. මෙම පරිච්ඡේදය යටතේ කරන ඕනෑම කාර්යයකදී පුද්ගලිකව හෝ නියෝජිතයෙකු මාර්ගයෙන් කරුණු කීමට අවසරපත්‍ර ලාභියාට හැකි විය යුතු ය. — පුද්ගලිකව හෝ නියෝජිතයෙකු මගින් කරුණු කීමට හැකි බව.

29. (1) මෙම ප්‍රඥප්තියේ අරමුණ හා කාර්යයන්ට හානියක් නොවන පරිදි පළාත තුල පිහිටි රජයේ ඉඩම් සහ පළාත් සභාව වෙත ලැබී ඇති ඉඩම්වලින් නියමිත ප්‍රමාණයන්ට අනුකූලව බදු ගාස්තු, දඩ හා ආදායම් අයකර ගැනීමට පළාත් සභාවට බලය ඇති අතර, එම මුදල් පළාත් සභා අරමුදලට බැර කළ යුත්තේ ය. — ඉඩම් ආදායම්.

(2) පළාත් සභාව වෙත ලැබී ඇති ඉඩම් සහ පළාත් සභා බල ප්‍රදේශ තුළ පිහිටි රජයේ ඉඩම් අවසර පත්‍රයක් හෝ බදුකරයක් මත බැහැර කිරීමේදී අයකළ යුතු ගාස්තු නියම කිරීමට රජයේ ඉඩම් ආඥාපනතේ ප්‍රතිපාදනවලට යටත්ව පළාත් සභාවට බලය ඇත්තේ ය.

30. පළාත තුළ පිහිටි රජයේ සහ පළාත් සභා ඉඩම් පිළිබඳ තොරතුරු පද්ධතියක් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ වගකීම වන්නේ ය. එම තොරතුරු ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් මට්ටමින් සකස් කරනු ලැබිය යුතු ය. පළාත තුළ පිහිටි ආණ්ඩුවේ ප්‍රයෝජනයට ගනු ලබන රජයේ ඉඩම් සහ පළාත් සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන රජයේ ඉඩම් පිළිබඳ නියමිත තොරතුරු මෙම තොරතුරු පද්ධතියට ඇතුළත් විය යුතු ය. — ඉඩම් තොරතුරු පද්ධතිය.

31. පළාත තුළ පිහිටි ඕනෑම රජයේ හෝ පළාත් සභා ඉඩමක්, පරීක්ෂා කරනු ලැබීමට හෝ තොරතුරු ලබා ගැනීමට ඕනෑම දිනයක පෙ. ව. 6.00ත් ප. ව. 6.00ත් අතර ඕනෑම වේලාවක එම ඉඩමට ඇතුළුවීමට පළාත් ඉඩම් කොමසාරිස් හෝ ඔහු විසින් විධි වූ ලියවිල්ලකින් බලය පවරන ලද කවර හෝ අයෙකුට බලය ඇත්තේ ය. — අවසරපත්‍රයක් මත දුන් ඉඩමකට බලය පවරන ලද බලධාරියාට ඇතුළුවිය හැකි බව.

32. (1) පළාත් සභා වෙත ලැබී ඇති ඉඩමක එකී ඉඩම වෙනුවෙන් නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක් හෝ නීත්‍යානුකූල ලියවිල්ලක් නොමැතිව, — ඉඩම් සම්බන්ධ නිත්‍යානුකූල නොවන ක්‍රියා.

(අ) එළි පෙහෙළි කිරීම
(ආ) වැටකොටු බැඳීම
(ඇ) පස පෙරලීම
(ඈ) කැනීම
(ඉ) වගා කිරීම

(ඊ) යම් ගොඩනැගිල්ලක් හෝ එහි කොටසක් ඉදි කිරීම

(උ) පදිංචි වීම

යන ඕනෑම ක්‍රියාවක් කරන අයෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත් අධිකරණයක ලඝු නඩු විභාගයකින් පසුව වරදකරුවෙක් කරනු ලැබුවහොත් බරපතල වැඩ සහිතව අවුරුද්දකට අඩු නොවන අවුරුදු තුනකට වැඩි නොවන සිර දඬුවමක් හා/හෝ රුපියල් දහසකට අඩු නොවන රුපියල් දසදහසකට වැඩි නොවන දඩයකට හා/හෝ මෙකී දඬුවම් දෙකටම එකවර යටත් කළ හැකි ය.

(2) ඉහත (1) උප වගන්තිය යටතේ ක්‍රියාවන් සිදු කිරීම හේතු කොට ගෙන යම් පුද්ගලයෙකු වෙත පමුණුවනු ලැබිය හැකි දඬුවමකට අමතරව ඔහු රජයේ ඉඩමක් ලැබීමට නුසුදුස්සෙකු වන අතර, අසාධු ලේඛණගත කළ යුතු ය.

(3) පළාත් සභාව වෙත ලැබී ඇති ඉඩමක හෝ රජයේ ඉඩමක අනවසර සන්තකය සම්බන්ධයෙන් 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ විධිවිධාන එලෙසින්ම අදාල වන්නේ ය.

බස්නාහිර පළාත් ඉඩම් උපදේශක සභාවක් පිහිටුවීම.

33. (1) බස්නාහිර පළාත් සභාව විසින් පළාත් ඉඩම් උපදේශක සභාවක් පිහිටවිය යුතු අතර, එම උපදේශක සභාව පළාත තුළ පිහිටි පළාත් සභාව සතු ඉඩම් පාවිච්චිය හා සම්බන්ධ පළාත් ප්‍රතිපත්තිය සකස් කිරීම පිළිබඳව වගකිව යුතු ය. පළාත් ඉඩම් ප්‍රතිපත්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ, II වැනි පරිශිෂ්ඨයේ, 33.4 උප වගන්තිය යටතේ සම්පාදනය කරනු ලබන ජාතික ඉඩම් ප්‍රතිපත්තියට අනුකූල විය යුතු ය.

(2) මෙම උපදේශක සභාව පහත සඳහන් ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි නිලධාරීන්ගෙන් සමන්විත යුතු ය :

(අ) ඉඩම් පරිහරණ සැලසුම්
(ආ) රේඛීය කෘෂිකර්ම හා පළාත් කෘෂිකර්ම
(ඇ) මහා වාරිමාර්ග හා පළාත් වාරිමාර්ග
(ඈ) පළාත් පාලන
(ඉ) මිනුම්
(ඊ) වන සංරක්ෂණ
(උ) වන ජීවී
(ඌ) ගොවිජන සේවා
(එ) පරිසර සංරක්ෂණය
(ඒ) පුරාවිද්‍යා
(ඔ) භෞතික සැලසුම්
(ඕ) නාගරික සංවර්ධන

(3) ඉහත සඳහන් 2 උප වගන්තියේ නියෝජනයන්ට අමතරව පහත සඳහන් එක් එක් ක්ෂේත්‍ර නියෝජනය වන රාජ්‍ය නිලධාරීන් නොවන, විශේෂඥ දැනුමක් ඇති විද්වතුන් හතර දෙනෙක් මෙම සභාවේ සාමාජිකයන් විය යුතු යුතු ය :

(අ) ස්වභාවික සම්පත් කළමනාකරණය
(ආ) සමාජ විද්‍යාව
(ඇ) ආර්ථික විද්‍යාව
(ඈ) නීති ක්ෂේත්‍රය

(4) අමාත්‍යාංශයේ ලේකම්වරයා මෙම සභාවේ සභාපති විය යුතු අතර, පළාත් ඉඩම් කොමසාරිස්වරයා එහි ලේකම් විය යුතු ය. ඊට අමතරව පළාතේ දිස්ත්‍රික් ලේකම්වරුන් නිල බලයෙන් මෙම උපදේශක සභාවේ සාමාජිකයන් විය යුතු ය.

34. (1) පළාත් ඉඩම් උපදේශක සභාව සතු බලතල හා කාර්යයන්වලට පහත සඳහන් කාරණා අඩංගු වේ. පළාත් ඉඩම් උපදේශක සභාවේ බලතල හා කාර්යයන්.

(අ) ඉඩම් පාවිච්චිය පිළිබඳ පළාත් ප්‍රතිපත්තිය තීරණය කිරීම හා ප්‍රකාශයට පත් කිරීම

(ආ) පළාතක් ඇතුළත ඇති රජයේ ඉඩම් යම් පුරවැසියෙකුට හෝ සංවිධානයකට පවරා දීම හෝ නියාදනය කිරීමේදී අදාල පළාත් සභාවේ උපදේශය එම කාරණය පාලනය කරන නීතිරීති වලට අනුකූලව අදාල බලධාරීන් වෙත යොමු කිරීම.

(ඇ) ඇමතිවරයා විසින් යොමු කරනු ලබන කාරණා සම්බන්ධයෙන් විමර්ශනය කර, නිර්දේශ ඉදිරිපත් කිරීම.

(ඈ) ජාතික ඉඩම් කොමිසම විසින් ජාතික ප්‍රතිපත්තියට අදාළව පළාත් සභාව වෙත යොමු කරනු ලබන කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීම.

(ඉ) ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේදී ඊට අදාලව පළාත වෙනුවෙන් සැලකිය යුතු කරුණු ජාතික ඉඩම් කොමිසම වෙත ඉදිරිපත් කිරීම.

(2) තමන්ට පැවරුණු කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි දත්ත, වාර්තා, සිතියම්, ලේඛණ හා ජාතික ඉඩම් කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන වෙනත් තොරතුරු, නිර්දේශ හා නිරීක්ෂණ සපයන ලෙස පළාත් සභාවේ ඕනෑම නිලධාරියෙකු හෝ ආයතනයක් වෙත නියම කිරීමට උපදේශක සභාවට බලය ඇත්තේ ය.

(3) උපදේශක සභාවේ සභාපති, ලේකම් සහ නිල බලයෙන් පත්විය යුතු සාමාජිකයන් හැරුණු විට අනෙකුත් සාමාජිකයන් පත් කිරීම අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශය මත පළාතේ ආණ්ඩුකාරවරයා විසින් පත් කළ යුතු වන්නේ ය.

(4) පත් කරනු ලැබූ කමිටු සාමාජිකයන්ගේ නිල කාලය වසර තුනක් නොඉක්මවිය යුතු අතර, එම කාලය අවසානයේ නැවත පත් කරනු ලැබීමට හිමිකම් ඇත්තේ ය.

35. (1) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වන රීති පළාත් ඉඩම් උපදේශක සභාවේ උපදේශනය මත අමාත්‍යවරයා විසින් සාදනු ලැබිය යුත්තේ ය. රීති සෑදීම

(2) ඉහත (1) වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එසේ පළ කිරීමෙන් පසුව ඊට අනුමැතිය දීම සඳහා හැකිතාක් ඉක්මනින් යෝජනාවක් මඟින් පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සාදන ලද කිසිම රීතියක් පළාත් සභාව විසින් අනුමත කරනු ලබන තුරු සහ ඒ අනුමැතිය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තුරු වලංගු නොවන්නේ ය.

36. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට බස්නාහිර පළාත් සභාවේ 2002 අංක 07 දරන ඉඩම් සංවර්ධන ප්‍රඥප්තිය පරිච්ඡින්න වේ.

37. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියේ "අමාත්‍ය මණ්ඩලය" යන්න බස්නාහිර පළාතේ අමාත්‍ය මණ්ඩලය ද

"අමාත්‍යවරයා" යන්නෙන් බස්නාහිර පළාතේ ඉඩම විෂයභාර අමාත්‍යවරයා ද

"ලේකම්" යන්නෙන් බස්නාහිර පළාතේ ඉඩම් විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් ද,

"අවසර පත්‍ර" යන්නෙන් ඉඩම් විෂය හා සම්බන්ධ ලිඛිත නීතියක් යටතේ ලද අවසර පත්‍රයක් ද,

"අවසරපත්‍ර ලාභියා" යන්නෙන් ඉඩම් විෂය හා සම්බන්ධ ලිඛිත නීතියක් යටතේ ලද අවසර පත්‍රයක් ලැබූ පුද්ගලයෙක් හෝ ආයතනයක් හෝ සංවිධානයක් ද

"ආණ්ඩුව" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රාජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව බලයට පත් වන ආණ්ඩුව ද

"ඉඩම" යන්නෙන්

(අ) ස්වභාවික හෝ කෘත්‍රිම හෝ ඕනෑම ජලාශයක හෝ ජල මාර්ගයක පත්ල අඩංගු භූමිය ද,

(ආ) පෘථිවියට සම්බන්ධ වී ඇති හෝ එසේ පෘථිවියට සම්බන්ධවී ඇති දේවලට ස්ථිරව සම්බන්ධ වී ඇති කිසියම් දෙයක්

(ඇ) ඉඩමට ඇති කිසියම් හිමිකමක් හා/හෝ ඉඩමේ කරමින් තිබෙන හෝ කරන්නට බලාපොරොත්තු වන ඕනෑම ගොවිතැනක සම්බන්ධතාවයක් ද

"ඉඩම් බැහැර කිරීම" යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ ඉඩම් බැහැර කිරීම ද,

"ඉඩම් කච්චේරිය" යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ ඉඩම්ලාභීන් තෝරාගැනීම සඳහා පවත්වනු ලබන පරීක්ෂණයක් ද,

"නියාදනය" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දී ඇති අර්ථයම අදහස් වන්නේ ය.

"ඉඩම් කොටස" යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ බෙදා දෙන ලද ඉඩමක් හෝ එහි ඕනෑම කොටසක් ද

"ඉඩම් නිලධාරියා" යන්නෙන් මෙම ප්‍රඥප්තියේ 12 වැනි වගන්තිය යටතේ පත් කරන ලද නිලධාරියෙක් හා නිශ්චිතාර්ථයෙන් ගත්විට එයින් අදහස් වන්නේ කිසියම් විශේෂ ඉඩමක් සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරියෙකු ද

"ඉඩම්ලාභියා" යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ ඉඩමක් ලැබීමට තෝරාගනු ලැබූ ඉඩමක් ලැබූ පුද්ගලයෙක් හෝ ආයතනයක් හෝ සංවිධානයක් ද,

"පළාත් සභාව වෙත ලබාදී ඇති ඉඩම්" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ විධිවිධාන පරිදි පළාත් සභාවට ලබා දෙන ලදැයි සැලකෙන ඉඩම් හා පළාත් සභාව විසින් අත්කර ගන්නා ලද ඉඩම් ද,

අදහස් වේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

38. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

03-309

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.